**වී අලෙවි මණ්ඩලය - 2016**

**-----------------------------**

වී අලෙවි මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩල පනතේ 30 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2018 අගෝස්තු 24 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**----------------------**

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාවනය සඳහා පදනම**

**-------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**2.1 මතය ව්‍යාවනය**

**------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

සමාලෝචිත වර්ෂය අවසානයට ශුද්ධ වත්කම් රු.12,060,577,822 ක සෘණ අගයක් ගෙන තිබූ අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 96 කින් වැඩි වී තිබුණි. එමෙන්ම මණ්ඩලය නිරන්තරයෙන් මිලදීගෙන තිබූ වී තොග වෙළඳපොළ මිලට හා පිරිවැයට වඩා අඩු මිලකට විකිණීම හේතුවෙන් ඊළඟ කන්නයේ වී මිලදීගැනීම සඳහා අවශ්‍ය අරමුදල් සපයා ගැනීමට සහ අලෙවියෙන් වූ පාඩු පියවා ගැනීමට වාර්ෂිකව මහා භාණ්ඩාගාරයෙන් සහ රාජ්‍ය බැංකු වෙතින් ණය පහසුකම් ලබා ගැනීමට කටයුතු කර තිබුණි. 2009 වසරේ සිට 2014 වසර දක්වා වී මිලදී ගැනීම හා මෙහෙයුම් වියදම් සඳහා රජයේ බැංකු 03 කින් ලබාගෙන තිබුණු ණය හා අත්තිකාරම් මුදලින් 2017 දෙසැම්බර් 31 දින වන විට සමුච්චිත ගෙවිය යුතු රු. මිලියන 17,965.3 ක් හා ඒ සඳහා ගෙවිය යුතු සමුච්චිත පොලිය රු.මිලියන 623.9 ක් වී තිබුණි. මේ අනුව රජයේ හෝ වෙනත් මූල්‍ය අනුග්‍රහයකින් තොරව මණ්ඩලයේ කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාමට නොහැකි තත්ත්වයක් ඇතිවිය හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය.

### 2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.3,322,135 ක් වූ ලොරි රථය 2015 වර්ෂය වන විට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. කෙසේ වුවද ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල එම ලොරි රථයේ ශුද්ධ පොත් අගය ලෙස රු.443,735 ක් දක්වා තිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

2016 වර්ෂයේ වැඩ අවසන් වී තිබුණු රු.1,310,073 ක් වූ ගබඩා නවීකරණයන් 2016 මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන වැඩ ගිණුමේ ඇතුළත් කර තිබුණි. ඒ හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ කෙරීගෙන යන වැඩ ගිණුමේ සහ ඉඩම් හා ගොඩනැගිලි ගිණුමේ ශේෂ එම ප්‍රමාණයෙන් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් සටහන් කර තිබුණි.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| | ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | වෙළඳ ණයගැති | | |
| | (i) හඳුනා නොගත් වී මිලදී ගැනීම් | 65,235,117 | විස්තරාත්මක තොරතුරු, ශේෂ සනාථ කිරීම් |
| | (ii) ගැනුම් පාලන ගිණුම | 49,743,530 | |
| | (iii) Rice Millers ණයට විකුණුම් | 45,049,804 | |
| | (iv) සමුපකාර තොග වෙළඳ සංස්ථාව | 462,689,308 | |
| | (v) ලංකා සතොස | 77,526,708 | |
| (ආ) | වියළීමේ පිරිවැය (Driage) | 290,772,157 | අදාල අනුපාතය තීරණය කිරීමේ අනුමැතිය |
| (ඇ) | භාණ්ඩාගාරයට ගෙවිය යුතු ශේෂය | 7,067,901,995 | ශේෂ සනාථ කිරීම් |

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට රු.2,013,370,698 ක් වූ ණයගැති ශේෂය තුල වසර 5 කට වැඩි රු.60,335,368 ක්, වසර 3 ත් වසර 5 ත් අතර රු.1,221,014,477 ක්,වසර 1 ත් වසර 3 ත් අතර රු.710,471,802 ක් හා වසර 1 ට අඩු රු.21,549,051 ක ශේෂ විය. මෙම ශේෂය තුල වී මිලදී ගැනීමට අදාල වසර 2 ත් වසර 3 ත් අතර හඳුනා නොගත් ශේෂය රු.65,235,117 ක් විය. මෙම ශේෂ අය කර ගැනීමට 2018 මාර්තු 20 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට රු.7,686,883,820 ක් වූ ණයහිමි ශේෂය තුල වසර 4 කට වැඩි රු.283,347,458 ක් , වසර 3 ත් වසර 4 ත් අතර රු.354,858,937 ක්, වසර 1 ත් වසර 3 ත් අතර රු.6,803,585,024 ක් හා අවුරුදු 1 ට අඩු රු. 245,092,402 ක ශේෂ විය. මෙම ශේෂ තුළ භාණ්ඩාගාරයට ගෙවිය යුතු රු.7,067,901,996 ක් වූ අතර එම ශේෂ නිරවුල් කර ගැනීමට 2018 ජුලි 20 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (අ) මුදල් රෙගුලාසි 188(2) | 2009 වර්ෂයේ සිට පැවත එන රු.9,865,253 ක් වූ උපලබ්ධි නොවූ තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂය අවසානයට පොත් අගය රු.9,692,405,242 ක් වූ වී තොග සම්බන්ධයෙන් භෞතික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.5,894,325,856 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.1,771,072,410 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,123,253,446 ක පිරිහීමක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම රු.8,464,174,689 කින් වැඩි වුවද විකුණුම් පිරිවැය, පරිපාලන වියදම් හා මූල්‍ය වියදම් පිළිවෙලින් රු.12,183,280,871 කින්, රු.24,446,534 කින් හා රු.371,968,211 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය සියයට 48 කින් පිරිහීමක් නිරීක්ෂණය විය. 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේ සියයට 09 කින්ද 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේ සියයට 57 කින්ද මූල්‍ය ප්‍රතිඵලය වර්ධනය වී තිබුණි. 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේ සියයට 239 කින් මූල්‍ය ප්‍රතිඵලය පිරිහී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2015 වර්ෂයේදී මණ්ඩලයේ රු.1,717,543,386 ක් වූ සෘණ දායකත්වය 2016 වර්ෂය වනවිට රු.5,824,719,237 ක සෘණ දායකත්වයක් දක්වා එනම් සියයට 239 කින් වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ ගබඩාවල වී ඇසිරීම සඳහා අවශ්‍ය වන බිම් රාක්ක 12,000 ක් රු.80,826,550 කට මිලදී ගෙන තිබුණු අතර එම බිම් රාක්ක මිලදී ගැනීමේදී රාක්කයක තිබිය යුතු තාක්ෂණික පිරිවිතර නිසි පරිදි පිළියෙල කර නොතිබීම හේතුවෙන් බිම් රාක්ක වල හැඩය වෙනස්වීම, වියලුණු දැව කඳන් භාවිතා නොකිරීම නිසා දැව කොටස්වල ඇණ ගැලවී යාම සිදු වී තිබුණු බව අභ්‍යන්තර විගණන වාර්තාවලින් නිරීක්ෂණය කර තිබුණි.

(ආ) 2015 අප්‍රේල් 22 දිනැති අංක pmb/f1/14/2015 දරන මණ්ඩලය විසින් නිකුත් කර තිබුණු අභ්‍යන්තර චක්‍රලේඛය ප්‍රකාරව අත්තිකාරම් ලබා ගන්නා දිනයේ සිට දින 07 ක් ඇතුළත පියවිය යුතු බව දන්වා තිබුණද 2015 වර්ෂයේ සිට 2018 ජුනි 10 දක්වා ලබා ගෙන තිබුණු අත්තිකාරම් වලින් 2018 ජුනි 10 දින වන විටත් රු.1,591,360 ක් පියවා නොතිබුණි. එසේම අත්තිකාරම් ලබාගෙන එය පියවා නොතිබියදී එම නිලධාරීන්ටම නැවත අත්තිකාරම් ලබා දී තිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට ලංකා බැංකුවට පියවිය යුතු බැංකු අයිරා ශේෂය රු.69,110,454 ක් වූ අතර එම ණය පොලිය රු.6,759,122 ක් විය.

(ඈ) මූල්‍ය ප්‍රකාශනවල දේපල පිරියත හා උපකරණ යටතේ ශුද්ධ අගය ශුන්‍ය වූ වශයෙන් දක්වා තිබුණු පිරිවැය රු.7,329,412 ක් වූ වත්කම් තවදුරටත් භාවිතා කිරීමට හැකි ඒවා නම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට හෝ භාවිතයට ගත නොහැකි ඒවා නම් සුදුසු පරිදි බැහැර කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

**4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

මණ්ඩලය සතුව භෞතිකව නොපවතින රු.54,385,222 ක් වූ තොග 2012 වර්ෂයේ සිට මාර්ගස්ථ තොග ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**4.3 හඳුනාගන්නා ලද පාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 ජූලි 27 දිනැති අංක අමප/16/1354/732/024 දරන "මහ කන්නයට පෙර මිලදී ගෙන තිබූ වී තොග බැහැර කිරීම" සම්බන්ධයෙන් වූ අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව 2014/15 මහ කන්නයේ වී කිලෝවක් රු.45 බැගින් මිලදී ගත් නාඩු වී මෙට්‍රික්ටොන් 595 ක් කිලෝවක් රු.42 බැගින් පෞද්ගලික සමාගමකට අලෙවි කිරීමෙන් මණ්ඩලයට රු.මිලියන 5.95 ක අලාභයක් සිදු වී තිබුණි.

(ආ) විවෘත වෙළෙඳපලට ඉදිරිකාලය තුළ අධික ලෙස සහල්තොග ගලාඒම නිසා අස්වැන්න නෙලන කාලයේදී වී ගබඩාව හිස්කර ගැනීම සඳහා මණ්ඩලය සතු වී කිලෝවක් රු.24 බැගින් සත්ත්ව ආහාර හා සහල් පිටි නිෂ්පාදනය සඳහා අලෙවි කිරීමට 2016 මාර්තු 02 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණු අතර ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්ගේ (සංවර්ධන හා සැලසුම්) 2016 මාර්තු 05 දිනැති අංක MRSA/5/2/1/1 මහ 2015/16 දරන ලිපියට අනුව වී අලෙවි මණ්ඩලය සතු මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු වී තොග ඇත්නම් එම තොග හඳුනාගෙන සත්ත්ව ආහාර ලෙස අලෙවි කිරීමට කටයුතු කරන ලෙස දන්වා තිබුණි. එසේ වුවද කිලෝවක් රු.45 බැගින් මිලදී ගත් හොඳ තත්ත්වයේ වී කිලෝග්‍රෑම් 88,616,309 ක් හා නාඩු වී කිලෝ 2,800,935 ක් කිලෝවක් රු.24 බැගින් පිළිවෙළින් සත්ත්ව ආහාර සඳහා පෞද්ගලික සමාගම් 09 කට හා සහල් පිටි නිෂ්පාදනය සඳහා සමාගම් 02 කට අලෙවි කිරීමෙන් පිළිවෙලින් රු.මිලියන 2,487.7 ක අලාභයක් හා රු.මිලියන 78.57 ක අලාභයක් සිදු වී තිබුණි.

(ඇ) 2015 ජූනි 17 දිනැති අංක 15/0744/608/013 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව 2014/15 මහ කන්නයේ මිලදී ගත් වී තොග අලෙවි කිරීම සඳහා පුවත් පත් දැන්වීම් පළ කර තිබූ අතර එහිදි ලැබුණු මිල ගණන් වෙළඳපොලේ පවතින මිලට වඩා අඩු වී තිබුණි. ඒ හේතුවෙන් 2015 සැප්තැම්බර් 02 දිනැති අංක CLT/5/6/1/1/මහ/2014/15 දරන ආහාර සුරක්ෂිතතාව අමාත්‍යාංශ ලේකම්වරයාගේ උපදෙස් පරිදි පුවත්පත් දැන්වීමට අදාලව මිළ ගණන් ලැබී තිබුණු ගැණුම්කරුවන් 11 දෙනෙකු ෆැක්ස් මගින් නැවත මිල ගණන් කැඳවා ඉහළම මිළ ඉදිරිපත් කළ ගැනුම්කරුට කිලෝවක් රු.46 බැගින් සම්බා වී කිලෝග්‍රෑම් 8,797,825 ක් හා කිලෝවක් රු.46.50 බැගින් කීරි සම්බා කිලෝග්‍රෑම් 3,623,761 ක් නිකුත් කර තිබුණි. කෙසේ වුවද මණ්ඩලය විසින් එම වී මිලදී ගෙන තිබුනේ කිලෝවක් රු.50 ක් බැගින් වීම නිසා වී විකිණීමෙන් මණ්ඩලයට රු.47,874,464 ක අලාභයක් සිදු වී තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව, මුදල් වර්ෂයක් සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද, 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2018 අප්‍රේල් 26 දිනදීය.

## 5.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම

-----------------------------------

2013 වර්ෂයේ වාර්ෂික වාර්තාව සඳහා 2018 ජුනි 05 දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබුණද 2018 අගෝස්තු 15 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. 2014 වර්ෂයේ වාර්ෂික වාර්තාව මණ්ඩලය විසින් පිළියෙල කරමින් පැවතුණි.

## 6. පද්ධති හා පාලනයන්

----------------------

විගණනයේදී අනාවරණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) වාහන පාලනය | ධාවන සටහන් නිසිපරිදි පවත්වා නොගැනීම හා ධාවන සටහන් වෙනස් කිරීම, වාහන ලේඛනයක් පවත්වා නොගැනීම, රාජකාරි අවශ්‍යතා සඳහා වාහන ලබා දීමේදී ඒ සඳහා ඉල්ලුම් කිරීම හා අනුමැතිය නිසිපරිදි සිදු නොවීම, ඉන්ධන ලබා ගැනීම් ධාවන සටහනට ඇතුළත් නොකිරීම |
| (ආ) ගබඩා පරිපාලනය | නිසි ප්‍රමිතියකින් යුතුව වී ගබඩා නොකිරීම, ගබඩා වාර්තා / ලේඛන යාවත්කාලීනව පවත්වා නොගැනීම |